දැන් මා සිටින්නේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ පන්තියේ ය. පසුගිය අවුරුදු කිහිපය තුළ ඇතිවුණු වෙනස-ʼවීම් අතර මතකයට නැගෙන සිද්ධි රාශියකි. බුලත්සිංහල ජ්‍යෙෂ්ඨ පාඨශාලාව මහා විද්‍යාලයක් බවට පත් වූයේ මෙම වකවානුවේ දී ය. පාසල් මිදුල කෙළවරේ තිබුණු කඳුගැටය ක්‍රමයෙන් ඉවත්ව මිදුල සමතලා වී විද්‍යාගාරය ගොඩ නැගිණි. එක් පොල්අතු ශාලාවක් ගැලවී වේදිකාව සහ දෙකෙළවරේ කාමර දෙකක් සහිත විශාල ශාලාවක් ගොඩ නැගිණි. එතෙක් පැරණි ශාලාවෙහි තිබූ විදුහල්පතිතුමාගේ කාර්යාලය නව ගොඩනැගිල්ලේ වේදිකාව පැත්තෙහි ඇති කාමරයට මාරුවිණි. අනිත් පස කාමරය සංගීතය උගන්වන කාමරය බවට පත් විය. ළිඳ පැත්තේ කර්මාන්ත සහ වඩුවැඩ සඳහා දෙපස වෙන් වූ ගොඩනැගිල්ල ගොඩනැගිණි. අවට පාසල්වල ළමයින් ඉහළ අධ්‍යාපනය සඳහා අපේ පාසලට පැමිණීම ආරම්භ විණි. විදුහල්පතිවරු කිහිප දෙනෙක් මාරු වී, ඩී. ඩී. ඒ. පෙරේරා යුගයට පිවිසීම පාසලේ ඇති වූ විවිධ වෙනස්වීම් සහ එවක ප්‍රගතියට මහත් පිටුවහලක් වුණු බව විශ්වාස කරමි. ඩී. ඩී. ඒ. පෙරේරා යුගය පාසලේ දීප්තිමත් යුගයක් ලෙස සඳහන් කළ හැක්කේ සිදු වූ විශේෂ වෙනස්කම්වලින් ඇති වුණු ප්‍රබෙ-ʼධය නිසා ය.

''පහනින් පහන සොයා'' ආදර්ශ පාඨය සහිත පාසල් ලාංඡනය නිර්මාණය වූයේ මෙම වකවානුවේ ය. ''ශාන්තිය සාදා එඩිගති වඩවා පොඩි හදවත් තුළ දිරිය කවා - මහ




විදුහල් මෑණී බුලත්සිංහල සැරදේවා කිතු දද නංවා'' යනුවෙන් ආරම්භ වී ගැයෙන, අදත් පාසලේ භාවිතවන පාසල් ගීතය සමරබන්දු එදිරිමාන්න සංගීත ගුරු මහතාගේ පද රච-නයක් අනුව එතුමාගේ සංගීතය සහිතව නිර්මාණය වූයේ ද මෙම යුගයේ දී ය.

කර්මාන්ත ගුරුවරයා ලෙස ඒ. බී. සී. ටී. විමලදාස මහතා පාසලේ කැපී පෙනෙන වෙනසකට හවුල්කරුවකු වූ බව සඳහන් කළ හැකි ය. එතෙක් පාසල් නාමපුවරුවක් නොතිබුණු අතර හොරණ කලවැල්ලාව මාර්ගයේ විදුහලට හැරෙන හන්දියේ ''බුලත්සිංහල මහා විද්‍යාලයය- බුලත්සිංහල'' යනුවෙන් ලියැවුණු, දෙපසට ම පෙනෙන නාමපුවරුව නිර්මාණය වී සවි වූයේ ඔහු අතිනි. ''සෑම දෙයකට ම මාර්ගයක් ඇත'' යන වදන සඳහන් වූ, මීයෙක් කිසියම් කෝටුවක එල්ලා ගත් යතුරු කැරැල්ලක්, ඇටවූ මී කතුරක් මතට කිට්ටු කරන දර්ශනීය පින්තූරය නිර්මාණය කර අපට දුන් වැදගත් පණිවුඩයේ හිමිකරුවා ඔහු ය. මාගේ නිර්මාණ කාර්යයට උත්තේජන වදන් එන්නතකින් සංග්‍රහ කර මා ඉදිරියට තල්ලු කෙරුවේ ද ඔහු ය. පොඩි පොඩි කෙටිකතා, කවි ආදිය ලියා පළමුව එතුමාට පෙන්වීමට මා පෙළඹුණේ එතුමාගේ කාරුණික අගැයීම නිසා ය. ''කවද හරි පියසේන හොඳට ලියන කෙනෙක් වෙයි'' යන විමලදාස මහතාගේ

කියමන, පොත්පත් කිහිපයක් ලියා එළි දක්වා ඇති මා, යම් තරමක ලේඛකයෙකු බවට පත් වීමට උත්තේජකයක් වන්නට ඇත.

ඩී. එස්. අතුකෝරළ සර් පාසලේ කැපී පෙනුණු ගුරු-වරයෙක් වූයේ එතුමාගේ පැවති සුවිශේෂී දක්ෂතා නිසා ය. අපට විද්‍යාව ඉගැන්වූයේ ඔහු ය. ගණන් ඉගැන්වූයේ ඔහු ය. ඔහු සාහිත්‍ය, ඉතිහාසය, භූගෝල විද්‍යාව, ප්‍රජාචාරය, චිත්‍රකර්මය යනාදී සියල්ල ඉගැන්වීමේ හැකියාව තුළින් සිප් සතර බෙදා දුන්නේ නිර්ලෝභීව ය. අ.පො.ස. (සා.පෙ.) විභාගය සඳහා සවස් වරුවේ ද අපට ඉගැන්-වූයේ එතුමා ය. තමා අතින් සත පනස්පහක් දී ළමයකු ලවා අතුර සිරිසඳ හෝටලයෙන් එළවළු බත් පාර්සලයක්



ගෙන්වා ගන්නා ඔහු දහවල් වේල ඉන් පිරිමසා ගෙන අප වෙනුවෙන් කැප වූ අයුරු ගෞරවයෙන් සිහිපත් කළ යුතු ය.

''දේවදාසී'' නාට්‍ය නිර්මාණය කොට ප්‍රධාන වේදිකාවේ රඟ දැක්වූයේ මෙම කාල වකවානුව තුළ කිසියම් දින කීපයක දී ය. පාසලේ අරමුදලක් ගොඩ නැගීම සඳහා මුදල් අයකොට පෙන්වන ලද නාට්‍යයකි ''දේවදාසී''. මේ සඳහා ප්‍රධාන ශාලාව පොල්අතුවලින් ඇහිරිණි. ශාලාවේ පන්තිවල තිබූ ඩෙක්ස් වෙනත් ශාලාවලට පිට වී අනෙකුත් ශාලාවල තිබූ පුටුවලින් පමණක් මෙම ශාලාවේ බිම වැසී ගියේ ය. වේදිකාව ඉහළින් තිබූ ත්‍රිකෝණාශ්‍රාකාර බාල්ක සැකිල්ල මෙම නාට්‍ය වෙනුවෙන් ම නිර්මාණය වූ දර්ශනීය චිත්‍රයකින් වැසී ගියේ ය. එම චිත්‍රය නිර්මාණය වූයේ ඩී. එස්. අතුකෝරළ ගුරු මහතාගේ සහ චිත්‍ර සඳහා පාසලේ දක්ෂ තමයා වූ සිරි පතිරගේ ශිෂ්‍යයාගේ දෑත් වලිනි.

පාසලේ ම ළමයින් විසින් රඟ දක්වන ලද ''දේවදාසී'' නාට්‍ය ඉතා ඉහළ ප්‍රතිචාරයක් ලබමින් දින දෙකක් ම ප්‍රදර්ශනය විය. පාසල් ළමුන්ට සත පනහක මුදලක් අය කළ අතර මහජනයා සඳහා රුපියල, රුපියල් දෙක, සහ පහ යනුවෙන් තුන් ආකාරයකට ටිකට් නිකුත් කළ බව මතකය කියයි. කටින්කට කතාබහ වන චරිතයක් බවට පත් වූ ''පොතේගුරා'' චරිතය කළ කේ. ඩී. උබේසේකර ශිෂ්‍යයාගේ රඟපෑම ඉතාමත් ජනප්‍රිය අංගයක් විය. සිටු කතාවක් වන මෙම ශෛලගත නාට්‍යයේ සිටුවරයා ලෙස ජයවර්ධන නම් වූ ශිෂ්‍යයා ද, සිටු දේවිය වශයෙන් මාලනී රණවක ශිෂ්‍යාව ද රඟ පෑ අතර ගුණසේන නම් වූ ශිෂ-ʼයයකු අන්ධයකුගේ චරිතයකට පණ දුන් බව මතක ය. එමෙන් ම මගේ මතකයේ හැටියට මල්ලිකා, වයලට්, එදිරිමාන්න, කොඩිප්පිලි ආදී ළමයින් රැසක් නාට්‍යයට සම්බන්ධ වී කටයුතු කළහ. පාඨශාලාචාර්ය ගුණදාස චන්ද්‍රරත්න මහතා කතාව ලියූ අතර පාසලේ සංගීත ආචාර්ය සමරබන්දු එදිරිමාන්න මහතාගේ නිෂ්පාදනයක් විය. විදුහල මහත් උත්සවශ්‍රීයෙන් බැබලුණු මෙම දින කීපය කිසි දිනක අමතක නොවන්නකි.

**එවකට ඉලංදාරි වයසට එබිකම් කරමින් සිටි අපගේ හැසිරීම් රටාවන් ද වෙනස් වී තිබුණි. කලිසමට යට කරන කමිසය, පිටුපසින් ඇද පහතට වන සේ දැමීම යැංකිය**

# ඉහළ පන්තිවලට

විද්‍යාව ඉගැන්වීම සඳහා පැමිණි එක්තරා ගුරුවරයකුගේ අතපසුවීමක් නිසා ''ප්‍රොස-ʼපරස්'' නම් වූ රසායනික ද්‍රව්‍යයක් මිදුලේ විසිරී තිබී, ඒවා අහුලා ගත් ළමයින් කිහිප දෙනෙකුගේ ම දෑත් පිළිස්සී මහත් කලබගෑනියක් ඇති වූ බව මතකය කියයි.

එවකට ඉලංදාරි වයසට එබිකම් කරමින් සිටි අපගේ හැසිරීම් රටාවන් ද වෙනස් වී තිබුණි. කලිසමට යට කරන කමිසය, පිටුපසින් ඇද පහතට වන සේ දැමීම යැංකිය දැමීම වශයෙන් හැඳින්විණි. හිසකෙස් ක්‍රේල් කරගැනීමේ පිස්සුවක් අප බොහෝ දෙනෙකුට වැළඳී තිබිණි. නළලට ඉහළින් කෙස් රෙ-ʼාදක් හැඩ වැඩ ලෙස සකස් කොට රඳවා ගැනීම බම්ප් එක තබා ගැනීම ලෙස හැඳින්විණි. කො-ණ්ඩය සකස්කර ගැනීම සඳහා නොයෙකුත් ආලේප වර්ග හිසෙහි තැවරීම පුරුද්දක් කොට ගතිමු. ඇල්වතුර හා පොල්තෙල් මිශ්‍රකොට හිසකෙස්වල ආලේප කිරීම, එඬරුතෙල්, සුවඳ එඬරුතෙල් ගෑම, වැස්ලින් යන ආලේප ගෑම ආදිය කළෙමු. ගල්කූරක පොල්තෙල් තවරා ඉටිපන්දමකින් රත්කර නළලට ඉහළින් ඇති කෙස්ගස් කිහිපයක් ගල්කූර වටා එතීමෙන් ඇතිවන රැල්ල නළල මැදට දමා ගැනීම ද එක් මෝස්තරයක් විය.

අප හතේ පන්තියේ සිටින කාලයේ දී විද්‍යාගාරය සාදා අවසන් විණි. එතෙක් කලා විෂ-යයන්ට පමණක් සීමා වී තිබූ පාසලේ අ.පො.ස. පන්ති සඳහා විද්‍යා සහ කලා යන අංශ දෙකට සිසුන් වෙන් කෙරිණි. සාමාන්‍ය පෙළ පන්තිවලට ළමයින් තේරීමේ දී ඒ, බී පන්ති දෙකේ ම ඉගෙනීමට දක්ෂ ළමයින් විද්‍යා අංශයටත් අනිත් ළමයින් කලා අංශයටත් වෙන් කෙරුණු අතර, තුනේ පන්තියේ සිට ම පන්තියේ පළමු වැනියා හෝ දෙ-වැනියා වීමේ දක්ෂතාවයෙන් යුතු වූ මා ද විද්‍යා අංශයට තේරීම අරුමයක් නොවී ය. එහෙත් අපේ උගත් පුංචිඅම්මා කෙනෙකුගේ උපදෙස් පරිදි

කලා අංශයේ ම ඉගෙන ගැනීමට මට සිදුවිය. ඇයගේ උපදෙස් වූයේ විද්‍යාව ඉගෙනීමේ දී බොහෝ විය පැහැදම් දැරීමට සිදුවන බව සහ ගෙම්බන් කැපීම ආදී පව්කාර වැඩ ද කරන්නට සිදුවන බව ය. ඇය තරයේ ම කියා සිටියේ කෙසේ හෝ කලා අංශයට දම්මවා ගත යුතු බව ය. ඇයගේ උපදෙස් ඉහළින් ම පිළිගත්, පාසල් අධ්‍යාපනයක් නොලද අම්මාගේ මතය වූයේ මා කලා විෂයයන් කළ යුතු ම බව ය. මගේ බලවත් අකමැත්ත මැද ඒ සඳහා කළේ නිවාඩු කාලය තුළ දී ම බුලත් අතක් ද රැගෙන අම්මා සමග ඩී. ඩී. ඒ. පෙරේරා විදුහල්පති තුමාගේ නිවසට ගොස් ඒ බව පවසා මා කලා පන්තියට දම්මවා ගැනීම ය. එවකට විද්‍යා ශිෂ්‍යයකු විසින් මගේ සමරු පොතක සඳහන් කර තිබුණු 'කලාවෙන් මුලාවූවෝ උඩ බලාගෙන සිටිති' යන වැකියට අනුව මගේ ජීවන ගමනේ දී උඩ බලාගෙන සිටීමට සිදු නොවීම ගැන මම අද ආඩම්බර වෙමි.

එක්තරා දිනක උදෑසන රැස්වීමේ දී විදුහල්පති ඩී. ඩී. ඒ. පෙරේරා මහතා රැස්වීම ඉදිරියට කැඳවූයේ අපේ පාසලේ ඉහළ ම පන්තියේ ඉගෙන ගත් පියදාස නම් වූ ශිෂ-ʼයයෙකි. පාසල් ඉතිහාසයේ මුලින් ම සරසවි පිවිසුම් පෙළ සමත් වී විශ්වවිද්‍යාලයට තේරුණු ශිෂ්‍යයා හැටියට ඔහුව හඳුන්වා දුන්නේ සියලු ගුරු හවතුන් ඇතුළු ළමයින්ගේ අත්පුඩි හඬ මධ-ʼයයේ ය. එදා අප දුටුවේ කෙසඟ සිරුරක් ඇති ඔහු, පාසලට විශාල ගෞරවයක් ලබාදුන් මහා වීරයකු ලෙස ය.

විද්‍යාගාරය විද්‍යා සිසුන්ගේ රා-ජධානිය බවට පත් වී තිබුණි. එම පිරිස කලා විෂයයන් හදාරණ සිසුන් ට වඩා සුවිශේෂී පිරිසක් හැටියට කැපී පෙනුණි. කලා සිසුන්ට විද්‍යාගාරය තුළට යාමටවත් නොහැකි ය. විද්‍යාගාරය තුළ ද පන්ති කිහිපයක් පැවැත්වුණු අතර ඒවා විද්‍යා සිසුන්ට පමණක් සීමා විය. විද්‍යාගාරය වටා මල් පෝච්චිවල මල් වවා අලංකාරව තිබුණු අතර මල් පිපෙන ගස්වලට වඩා තිබුණේ මල්වලින් තොර නොයෙකුත් විසිතුරු පැළ ය.

**මතු සම්බන්ධයි**